www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද රැකියා වාර්තාව ගැඹුරුවන පරිහානිය පෙන්නුම් කරයි

## US jobs report points to deepening slump

බැරී ග්‍රේ විසිනි
2010 ජූලි 03

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිකුරාදා නිකුත් කෙරුනු ජූනි මාසය සඳහා වන රැකියා වාර්තාවෙන්, ප්‍රකෘතිභාවයට පත්වීමක් පෙනෙනතෙක් මානයක නොමැති දිග් ගැසුනු ආර්ථික පරිහානියකට එක්සත් ජනපදය හසුව ඇති බව සනාථ කරයි. නිල හැඳින්වීම වන සෙමින් සිදුවන "ප්‍රකෘතිභාවයට" වඩා, ආර්ථික තත්වය හොඳින් විග්‍රහ කල හැක්කේ අවපාතයක් ලෙසට බව වාර්තාව යෝජනා කරයි.

මූලිකවම, එක්සත් ජනපද රජයේ තාවකාලික සංඛ්‍යාලේඛන රැකියා 225,000 ක් අවසන් වීමත් සමග, කෘෂිකාර්මික නොවන රැකියා 125,000 ක දල අහිමිවීමක් කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කලේය. කෙසේවුවද, ආර්ථික විශේෂඥයන්ගේ අනාවැකිවලට බොහෝ අඩුවෙන් සහ ශ්‍රම වෙලඳපොලෙහි සාමාන්‍ය මාසික වර්ධනය සමග පැවතීමට අවශ්‍යවන අලුත් රැකියා ප්‍රමානයෙන් අඩකට ආසන්න, 83,000 ක සුලු දල රැකියා සංඛ්‍යාවක් පුද්ගලික අංශය උත්පාදනය කලේය.

ජූනි වලදී පුද්ගලික අංශයේ රැකියාවල මෙම දුර්වල වැඩිවීම, මැයි මාසයේ පැවති ව්‍යසනකාරී තත්වය අනුව යාමක් විය. සිකුරාදා විශ්ලේෂනය, මැයි මාසයේ සංඛ්‍යා 41,000 සිට 33,000 ට පහල බසින අලුත්කිරීමකි.

රාජ්‍ය සහ ප්‍රාන්ත ආන්ඩුවල රැකියා 8,000 ක ශුද්ධ අහිමිවීමත් සමග, හිඟයෙන් ඔද්දල් වුන රාජ්‍ය සහ පලාත් ආන්ඩු විසින් කල රැකියා සහ සේවා කපාහැරීම්වල නව රැල්ලෙහි කම්පනය දැනෙන්නට පටන්ගෙන තිබේ.

රැකියා උත්පාදනයක් සිදුව ඇත්තේ බොහෝකොටම විවේක හා ආගන්තුක සත්කාර, සහ තාවකාලික උපකාරක කර්මාන්ත වැනි අඩු වැටුප් සහිත කර්මාන්තවලය.

පසුගිය මාස 5 තුල පැවති 25,000 ක සාමාන්‍යයට වඩා ඉතා අඩු අගයක් ගනිමින් නිෂ්පාදන රැකියා 9,000 කින් වර්ධනය වුනි. ඉදිකිරීම් අංශය තවත් රැකියා 22,000 ක් කපා හැරියේය.

වසර 25 ක් පුරා අවම අගයට ආසන්න වෙමින්, ශ්‍රම බලකාය තුල සමස්ත වැඩකරන වයස් සීමාවේ පසුවන්නන්ගේ ප්‍රතිශතය සියයට 64.7 තෙක් පහත වැටුනි.

මහා අවපාතයෙන් මෙපිට වඩා දරුනු රැකියා අර්බුදයක් නරක අතට වැඩෙමින් පවතින බව පමනක් මෙම සංඛ්‍යා පෙන්නුම් කරයි.

සිකුරාදා වාර්තාවට අනුව, 2007 දෙසැම්බරයේදී මන්දාවධමනයේ නිල ආරම්භයෙන් වසර දෙක හමාරකට පසු කම්කරුවන් මිලියන 15.2 ක් විරැකියාවෙන් පෙලෙන අතර මිලියන 25.8 ක් එක්කෝ විරැකියාවෙන් එසේ නැත්නම් තම සුදුසුකම්වලට වඩා අඩු රැකියාවක නිරතව ඇත. මිලියන 6.8 ක් මාස 6 කට වඩා වැඩි කාලයක් විරැකියාවෙන් පෙලෙමින් සිටිති. රැකියාවක් සෙවීම අතහැර දමා ඇති සහ අර්ධ-රැකියා කරන අතරේ පූර්න-රැකියා සොයන කම්කරුවන් ද ඇතුලත්ව සුදුසුකම්වලට වඩා අඩු රැකියාවක නිරතවන්නන්ගේ නිල අනුපාතය සියයට 16.5 ක් වේ.

කෙසේවුවද, යථාර්තය මෙම නිල සංඛ්‍යාවලින් පෙන්වන අඳුරු චිත්‍රයට වඩා බොහෝ දරුනුය.

සමහරවිට, උපහාසාත්මකව ගතහොත්, සිකුරාදා වාර්තාවේ සඳහන් වඩාත් ගැටලු සහගත කාරනාව වන්නේ මැයි මස සියයට 9.7 ක් වූ නිල විරැකියා අනුපාතය සියයට 9.5 කට නාම මාත්‍රිකව ඇද වැටීමයි. දිගුකාලීන විරැකියාවේ දැවැන්ත වර්ධනයේ ප්‍රතිපලයක් වන සංඛ්‍යාත්මක ශ්‍රම බලකායේ හැකිලීම මෙම බැස්මට සම්පූර්නයෙන්ම හේතු වේ.

මූලිකවම, දිගුකාලීන රැකියා විරහිත ජනයා රැකියා සෙවීම අතහැර දැමීම සහ එබැවින්, විරැකියා අනුපාතය ගනනය කිරීම සඳහා තවදුරටත් ඔවුන්ව නොසලකා හැරීමෙන්, නිල ශ්‍රම බලකාය 652,000 කින් හැකිලී තිබේ. මෙම කලකිරුනු කම්කරුවන් රැකියා සෙවීම දිගටම කරගෙන ගියේ නම්, ජූනි සඳහා නිල අනුපාතය සියයට 9.9 ක් විය හැකිව තිබින.

වැඩකරන ජනගහනයේ පුලුල්වන තට්ටු මත ආර්ථික අර්බුදයේ විපත්තිදායක කම්පනය දිගුකාලීන රැකියා විරහිතභාවයේ මට්ටම් විසින් පෙන්නුම් කෙරේ. විරැකියාවෙන් පෙලෙන්නන්ගෙන් සියයට 45.5 ක් සති 27 ක් හෝ ඊට වැඩි කාලයක් රැකියා විරහිතව සිටින බව කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කරයි (දිගුකාලීන විරැකියාවේ නිල මට්ටම). රැකියා විරහිතභාවයේ

සාමාන්‍ය කාලවකවානුව දැන් මාස හයකි (පෙර වාර්තාගත කාලසීමාවෙන් දෙගුනයකි).

ආර්ථිකයේ ගතිකත්වය නැතිවී ඇති බව සිකුරාදා විරැකියා වාර්තාවෙන් පෙන්වන තවත් කාරනාවකි. පැයක සාමාන්‍ය වේතනය මෙන්ම සතියක වැඩ කරන පැයගනන ද පහල ගොස් තිබේ.

සිකුරාදා රැකියා වාර්තාව එලි දකින්නේ දුර්වල වර්ධනයක් පෙන්නුම් කරන වාර්තා පෙලක් මධ්‍යයේය. සීඝ්‍රයෙන් අඩුවූ පාරිභෝගික විශ්වාස වාර්තාවක්, විකිනීමට ඇති නිවාස අලෙවියේ වාර්තාගත සියයට 30 ක බිඳ වැටීමක්, එජ මෝටර් රථ අලෙවිය ජූනි මාසය සඳහා ඉලක්කම් දෙකකින් පහල යාමක්, පලමු රැකියා විරහිත ප්‍රතිලාභ ඉල්ලීමේ බලාපොරොත්තු නොවූ ඉහලයාමක්, සහ දෙසැම්බරයෙන් මෙපිට නිෂ්පාදන ක්‍රියාවලියේ අගයයන්හි බැස්මක් ද මේ සතියේ පෙනෙන්ට තිබුනි.

මාස නවයක් පුරා ඉහලයාමකින් පසුව මුල්ම බැස්ම සහ 2009 මාර්තු සිට විශාලතම ඇදවැටීම සටහන් කරමින් මැයි මස දී කර්මාන්ත ශාලා ඇනවුම් සියයට 1.4 කින් පහල ගිය බව වානිජ දෙපාර්තමේන්තුව සිකුරාදා දිනයේදීම වාර්තා කලේය.

මිලියන ගනනක් වන කම්කරු පන්තික පවුල් මුහුන දෙන සමාජ ව්‍යසනය ගැන ඔබාමා පරිපාලනයේ, කොංග්‍රසයේ සහ දේශපාලන පක්ෂ දෙකෙහි උදාසීන බව තියුනුව මතුවී පෙනීම රැකියා වාර්තාව මගින් ගෙනහැර දක්වයි.

කම්කරු දෙපාර්තමේන්තු වාර්තාව එලිදැක්වූ දිනයේදී ම, ෆෙඩරල් විරැකියා ප්‍රතිලාභ දීර්ඝ නොකරමින් ජූලි 4 සතියක නිවාඩුව (ඇමෙරිකානු ජාතික දින සැමරුම) සඳහා කොංග්‍රසය කල් තැබිනි. ෆෙඩරල් අරමුදලින් වැඩිකල ප්‍රතිලාභ අවසන් වීමේ ප්‍රතිපලයක් ලෙසට, මිලියන 1.7 ක රැකියා විරහිත ජනතාවට විරැකියා චෙක්පත (ජාතිකව සතියකට සාමාන්‍යය වන ඩොලර් 335 ක සොච්චම් මුදල, බොහෝ ප්‍රාන්තවල මීට අඩු අගයකි) ලැබීම දැනටමත් නතර වී තිබේ. ජූලි මස අවසන දී මෙම අගය මිලියන 3.3 දක්වා ඉහල යනු ඇත.

ප්‍රාන්ත ගනනාවක මූල්‍ය අර්බුදය තවත් නරක අතට හරවමින් සහ ගුරුවරුන්, ගිනිනිවන භටයින්, සමාජ සේවකයන් ඇතුලු රාජ්‍ය සේවකයින් දස දහස් ගනනක් නෙරපා හරින්නට එමෙන්ම මූලික රාජ්‍ය සේවයෙහි නව හා තවත් දරුනු කපා හැරීම්වලට එම ප්‍රාන්තවලට ඉඩකඩ සලසමින් ඒවා සඳහා අරමුදල් වෙන්කිරීමට ද කොංග්‍රසය අසමත් විය.

රැකියා විරහිතයින්ගේ ප්‍රතිලාභ කපාහැරීම් ගැන කිසිදු උනන්දුවක් නොදැක්වූ ඔබාමා, ඒ වෙනුවට කොංග්‍රසය අනුමත කරන වෝල් ස්ට්‍රීට්හි අවශ්‍යතාවලට අනුකූලව සැකසූ දල රහිත මූල්‍යමය නියාමන පනතක් ගැන අවධානය යොමු කලේය.

"සෞභාග්‍යය අත ලඟම තිබේ" යනුවෙන් 1932 දී හර්බට් හූවර්ගේ ප්‍රකාශය සිහිගන්වමින්, සිකුරාදා දිනයේදී, ඊට සමාන ප්‍රකාශයකින් නව රැකියා විරහිත සංඛ්‍යාවලට ඔහු ප්‍රතිචාර දැක්වීය.

"වැරැද්දක් නොකරන්න." ඔහු ප්‍රකාශ කලේය, "අපි නිවැරදි දිශාවට යමින් සිටින්නෙමු." "බොහෝ ඇමරිකානුවන්ට අවශ්‍ය තරම් වේගයෙන් අප නොයනු ඇත." ඔහු එකතු කලේය.

මෙම නිවේදනය ජනතාව රැවටීමේ සහ දේශපාලනිකව නිරායුධ කිරීමේ අභිලාෂයෙන් යුතුව ආර්ථිකයේ යථාර්තය ඍජුව මුසාකරනය කිරීමකි. මෙය "ප්‍රකෘතිභාවයට පත්වීමේ ගිම්හානය" යනුවෙන් ගිය මාසයේ උප ජනාධිපති ජෝසප් බිඩෙන්ගේ ප්‍රකාශයේ ප්‍රතිරාවයකි.

ආර්ථිකය වැරදි දිශාවට යොමුව ඇති බවත්, සමහරවිට ඍන වර්ධනයකට ලිස්සා යා හැකි බවටත් රැකියා වාර්තාව ඉඟි කරයි. විරැකියාව, නිවාස සින්නවීම්, සහ පුද්ගලික බංකොලොත්වීම් පූර්ව යුද කාලීන මට්ටමට යන සහ වේතන, නිවාස මිලගනන්, හා විශ්‍රාම ඉතිරි කිරීම් විනාශයට පත්වන මෙවන් තත්වයන් යටතේ "නිවැරදි දිශාව" ගැන කතාකිරීම ඇමෙරිකානු ජනතාවගේ බුද්ධියට නිගා කිරීමකි.

කෙසේවුවද, ඔබාමා සේවය කරන සමාජ තට්ටුවල තත්වය නම් කොහෙත්ම නරක නැත. බැංකු වාර්තාගත තත්වයට ලංවන ලාභ උපයන අතරේ ඒවායේ ප්‍රධාන විධායක නිලධාරීන් ඩොලර් මිලියන ගනනාවක වැටුප් පාරිතෝෂික ලෙස ලබාගනී. වැටුප් තල පහත හෙලන්නටත් ශ්‍රම ඵලදායීතාවය ඉහල නැංවීමටත් සමාගම් දැවැන්ත විරැකියාව යොදා ගනිමින් සිටිති.

*මාකට් වොච්* නමැති වෙබ් අඩවි ලිපි පෙලෙහි ජූනි 29 දා පලවන බ්‍රෙට් ඇරෙන්ඩ්ස්ගේ ලිපියක, "සති කිහිපයකට පෙර ෆෙඩරල් රිසර්ව් විසින් පලකල ඉලක්කම්වලට අනුව, ආයතනික ලාභ අන්තය වාර්තාගත මට්ටම්වලට ආසන්නව පෙන්වයි. බොහෝ දෙනා අගයන ආර්ථික විශේෂඥ සහ *වෝල් ස්ට්‍රීට් රිවැලියුඩ්* හි කතෘ ඇන්ඩ්‍රු ස්මිදර්ස්, පලමු කාර්තුවේදී ආයතනික ලාභ අන්තය සියයට 36 ක අහස උසට නැගීමක් ෆෙඩරල් රිසර්ව්හි අරමුදල් ගලායාම නමැති වාර්තාවෙන් ගනනය කරයි. වාර්තා තැබීමට පටන් ගැනුනු 1947 සිට ඒවා මෙතරම් ඉහල අගයක් ගෙන නැත. රොනල්ඩ් රීගන්ගේ කාලසීමාවේ සටහන් වූ ඉහලම අගය සියයට 30 ක් විය."

උතුරු ඇමෙරිකාවේ සුපිරි ධනවතුන් ගිය වසරේදී තමන්ගේ ධනවත්භාවය සියයට 18 ඉදිරි පිම්මක වර්ධනයක් දුටු බවට තක්සේරු කරන මෑතකාලීන වාර්තාවක් ඇරෙන්ඩ්ස් ගෙනහැර දක්වයි.

"ආර්ථිකය ගැන විශාලතම බොරු තුන" යනුවෙන් නම්කල ඔහුගේ ලිපියෙහි සංඛ්‍යාලේඛන උපුටා දක්වමින් එක්සත් ජනපද විරැකියාවේ සත්‍ය මට්ටම සියයට 25 ක් පමන බව ඇරෙන්ඩ්ස් පෙන්වා දෙයි. එජ කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත

විශ්ලේෂනය පෙන්වා දෙන්නේ ඇමෙරිකාවේ අවුරුදු 25 සහ 65 අතර වයසෙහි මිලියන 79 ක ජනතාවක් සිටින බවයි. ඔවුන්ගෙන් ආසන්නව මිලියන 18 ක් හෝ සියයට 22 ක් සම්පූර්නයෙන්ම රැකියා විරහිතය. (1950 හිදී එම අනුපාතය සියයට 10 කට අඩු විය.) පූර්න-කාලීන රැකියා නොමැතිකමින් අර්ධ-කාලීන රැකියා කරන්නන් මෙම ගනනය කිරීමට එක්කර නැත. ඔවුන් එකතු කලේ නම්, මූලික වැඩකරන වයසේ පසුවන හතර දෙනෙක්ගෙන් එක් අයෙක් පමන පූර්න-කාලීන රැකියාවක් නොමැතිව පසුවෙයි.

© www.wsws.org